ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 2018

---------------------------------------------------------------------------

## 1.1 මතය ව්‍යාවනය

-------------------

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරියේ") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ නොකරමි. විගණන වාර්තාවේ මතය ප්‍රතික්ෂේප කිරීමේ පදනමෙහි සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමනොහැකි විය.

## 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

-----------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුනේ දැයි තීරණය කිරීමට මට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය කරන ලදී. (ශ්‍රී.ලං.වි.ප්‍ර.) එම ප්‍රමිති යටතේ ඇති මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම් ඡේදයේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1. 4 විගණකගේ වගකීම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණනයක් පවත්වා විගණන වාර්තාවක් නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකිවිය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් සහ විගණනයට ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක උපලේඛනවල ගිණුම් අයිතම 16 ක රු.9,132,850 වෙනසක් පැවතුණි. එබැවින් විගණනයේදී එම ගිණුම් අයිතමයන්ගේ නිරවද්‍යතාවය ගැටළු සහගත විය. | 2019 මූල්‍ය ප්‍රකාශනවල ලෙජර ගිණුම් ශේෂයන් සංසන්දනය කිරීම සහ සවිස්තරාත්මක උපලේඛනයක් සකස් කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ලෙජරවල ශේෂයන් සහ වෙනත් උපලේඛන වල ශේෂයන් කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.)

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. - 7 - දේපල පිරියත සහ උපකරණ;<br>සම්පූර්ණ කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල පිරියත සහ | ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. - 07 අනුව නිසි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමට පියවර ගනු ලැබේ. එය 2019 මූල්‍ය ප්‍රකාශනවල සවිස්තරාත්මක උපලේඛන සමඟ ඉදිරිපත් කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට අධිකාරිය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපකරණවල පිරිවැය වූ රු. 921,569,395ක් හා ක්ෂය වෙන් කිරීම් රු. 341,783,232 ශේෂයන් වල සම්පූර්ණත්වය, භෞතික පැවැත්ම සහ නිරවද්‍යතාවය පරික්ෂා කිරීමට නොහැකි විය. තවද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල පිරියත සහ උපකරණ තුල හඳුනා නොගත් සහ නොසැසඳෙන ආරම්භක වත්කම් වටිනාකම රු .335,204,308 කි. | | |
| (ආ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. - 9 - තොග | 2018 දෙසැම්බර් 31 දිනට රු. 142,251,060 ක් තොග සත්‍යාපන වාර්තා හා භෞතික තොග ශේෂයන් නිරීක්ෂණය කිරීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් තොග ශේෂයන්ගේ පැවත්ම පිළිබඳ ස්වාධීන තහවුරු කිරීමක් ලබාගත නොහැකි විය. | සෑම මූල්‍ය වර්ෂයක අවසානයේම තොග සඳහා ස්වාධීන භෞතික සත්‍යාපනය කිරීමට පියවර ගනු ඇත. 2019 වර්ෂය සඳහා විස්තරාත්මක තොග සම්බන්ධ වාර්තා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු තොග ශේෂයන් පිළිබඳ ස්වාධීන භෞතික සත්‍යාපනයක් සිදු කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 01 වන විට උපචිත වියදම්වල ශේෂය රු. 16,240,668 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු. 17,876,237 ක මුදලක් උපචිත වියදම් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. රු .1,635,569 ක්වූ එම අතිරික්ත මුදල සමුච්චිත අතිරික්තයට/ ඌනතාවයට ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් වලින් අඩු කර ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම් සහ උපචිත වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03ට අනුව 2019 වර්ෂයේදී මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කරනු ඇත. | උපචිත වියදම් නිවැරදිව හඳුනා ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු අතර ඒ අනුව ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ)කොන්ත්‍රාත්කරුට ගෙවන ලද එකතු කළ අගය මත බදු (වැට) රු. 670,644 ක් එකතු කළ අගය මත බදු පාලන ගිණුමට හර කිරීම වෙනුවට ප්‍රමාද දෝෂයකින් කොන්ත්‍රාත්කරුවන්ගේ අත්තිකාරම් ගිණුමට හර කර ඇති අතර පසුව ඉහත දෝෂය නිවැරදි කිරීම සඳහා එම | 2019 දී ගිණුම්කරණ දෝෂය අදාල ගිණුම් වල නිවැරදි කරන ලදී. | මූලික ගිණුම්කරණ මූලධර්ම මගින් අනාගතයේ දී මෙවැනි දෝෂ අවම කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලම නැවතත් කොන්ත්‍රාත්කරුවන්ගේ අත්තිකාරම් ගිණුමට හර කර වැට් බදු පාලන ගිණුමට බැර කර ඇත. එම නිසා ගිණුම් දෙකම රු. 1,341,288 කින් වැඩියෙන් දැක්වේ. | | |
| (ඇ) | ජංගම නොවන වත්කම් ඉවත් කිරීමෙන් ලැබෙන ලාභය ලෙස රු. 2,169,034 ක් අවසන් ගිණුම්වල පෙන්වා ඇති අතර එම විකිණීම් වලට අදාළ පිරිවැය හා ක්ෂය වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නොතිබුණි. තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලද ආදායම ලෙස රු. 3,097,246 ක වටිනාකමක් දක්වා තිබුණි. එමනිසා ස්ථාවර වත්කම් ඉවත් කිරීම සම්බන්ධයෙන් අවසන් ගිණුම් වල කරන ලද ගැලපීම් වල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07ට අනුව විකුණනු ලබන වත්කම්වලට අදාල පිරිවැය, සමුච්චිත ක්ෂය සහ අදාළ ගිණුම් වලින් විකිණීමෙන් ලබන ආදායම ගිණුම්ගත කිරීමට පියවර ගනු ඇත. ඉවත් කල වත්කම් වල විස්තරාත්මක තොරතුරු 2019 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා මගින් ඉදිරිපත් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ක්‍රමය පිළිබඳ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අධිකාරිය විසින් ජංගම ගිණුම් දෙකක් සඳහා පිළිවෙලින් එක් ගිණුමක 2018 ජුනි මාසයේ සිට දෙසැම්බර් දක්වාද, අනෙක් ගිණුමේ 2018 දෙසැම්බර් මාසය සඳහා පමණක්ද මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දක්වා එම මාස වලට අදාල බැංකු ප්‍රකාශන ශේෂයන් හා මුදල් පොතේ (පොදු ලෙජර්) ශේෂයන් අතර රු.149,379,649 ක නොසැසඳෙන ශේෂයන් පැවතුණි. තවද 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල නොසැසඳුණු මුදල් ශේෂය රු. 276,021,675 ක් හා අතැති මුදල් ශේෂය රු. 16,116,434 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත නොවූ ආදායම් සහ වියදම් පවතින බවට විගණනයේදී බැහැර කළ නොහැකිය. මීට අමතරව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති මුදල් හා මුදල් සමාන දෑ ශේෂය වූ රු. . 450,649,044 හා රු. 23,261,094 ක නිරවද්‍යතාවය හා සම්පූර්ණ බව | සෑම වසරකම දෙසැම්බර් 31 දිනට පෙර සියලුම බැංකු සැසඳුම් සකස් කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය කළමණාකරණය පිළිබද ඵලදායි පාලනයක් සහතික කිරීම තුලින් ආයතනය තුළ වංචා හෝ විෂමාචාරයන් සිදුවීමට තිබෙන අවස්ථා වැලැක්වීමට කළමණාකරනය කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| පිළිබඳ විගණනයේදී විශ්වාසය තැබිය නොහැකිය. | | |
| (ආ) අධිකාරිය විසින් සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සමඟ සෑම මසකම අවසානයේ දී සාමාන්‍ය ලෙජරවල පෙන්වන මුදල් පොත් ශේෂයන් අතර වෙනස්කම් පවතින අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව, එම සංඛ්‍යා දෙක අතර හඳුනා නොගත් වෙනස්කම් රු .9,045,270 ක් විය. | ලෙජරයේ නිවැරදි ශේෂයන් සහ වෙනත් උපලේඛන සැලකිල්ලට ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගනිමින් සිටී. | ලෙජරවල ශේෂයන් සහ වෙනත් උපලේඛන සලකා බැලීමෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නිසි අවධානය යොමු කළ යුතුය |

### 1.5.5 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ව ප්‍රකාශයේ අවසන් ගිණුම් තුළ හඳුනා නොගත් රිසිට්පත් ලෙස රු. 625,570 ක් දක්වා තිබුණි. | වාර්තාගත කාල සීමාව තුළ ආයතනයේ ආදායමක් ලෙස හඳුනා නොගත් රිසිට්පත් ගිණුම් ශේෂය මාරු කිරීමට පියවර ගනු ලැබේ. | අවිනිශ්චිත ගිණුම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) අනුග්‍රාහකත්වය සහ ඉදිකිරීම් විශිෂ්ටතා ආදායම | 4,032,500 | ඉදිකිරීම් විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ උත්සවය පැවැත්වීම සඳහා අනුග්‍රාහකත්වය ලබා ගැනීම සඳහා අධිකාරියේ ලියාපදිංචි ආයතන වෙත කරන ලද ඉල්ලීම් ලිපි සහ එම ඉල්ලීම් මත ලැබුණු සත්‍ය මුදල ඇතුළත් ලිපිගොනු. | 2019 මූල්‍ය ප්‍රකාශන සඳහා වැඩසටහන් වලට අදාළ සියලුම ලේඛන සාක්ෂි ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගනුදෙනු සහ මුදල සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීම සහ පිළිගැනීම සඳහා විගණනය සඳහා සියලු ලේඛන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) "ශිල්ප සවිය" වැඩසටහන | 121,734,231 | පවත්වන ලද වැඩසටහන් ගණන, සහභාගිවන්නන්ගේ ලැයිස්තුව, | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | පුහුණු වැඩසටහන් වල මාතෘකා සහ අධීක්ෂණ හා ඇගයීම් වාර්තා වැනි තොරතුරු | | |
| ඇ) ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පාඨමාලාව | 15,951,137 | -එම- | -එම- | -එම- |
| (ඇ) ණයගැති ශේෂය | 14,876,930 | ණය ගැතියන්ගේ ශේෂ සනාථ කිරීම් | ණය ගැතියන් හට ශේෂ තහවුරු කිරීමේ ලිපි යැවීමට පියවර ගෙන ඇති අතර 2019 වර්ෂයේ ණයගැතියන්ගේ හිඟ මුදල් අවම කිරීමට පියවර ගෙන තිබේ. | -එම- |
| (ඉ) ණයහිමි ශේෂය | 11,302,490 | තහවුරු කිරීම්, කාල විශ්ලේෂණය සහ සවිස්තරාත්මක උපලේඛන. | ණය හිමියන් හට ශේෂ තහවුරු කිරීමේ ලිපි යැවීමට පියවර ගෙන ඇති අතර ණය හිමියන් හට ගෙවිය යුතු ශේෂය 2019 සිට අවම කිරීමට පියවර ගෙන තිබේ. | -එම- |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

----------------

| විගණන නිරීක්ෂණය<br>------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට වසර තුනකට වැඩි කාලයක් අයකර නොගෙන හිඟව තිබූ ණයගැති ශේෂය රු. 7,210,101 ක් විය. ඒ තුල වසර පහකට වැඩි රු.6,415,111 ක ශේෂයක් පැවතුණි. | සියලුම ණය ගැතියන්ගේ හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගනිමින් සිටී. සීඩා ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, ආපසු අයකර ගත නොහැකි ණය ගැතියන්ගේ ශේෂයන් (100% අඩමාණ ණය ලෙස වෙන්කිරීමට) විගණන, කළමනාකරණ කමිටුවේ සහ අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලයේ නිසි අනුමැතිය ලබාගෙන ගිණුම් පොත් වලින් ඉවත් කරනු ලැබේ. | නිසි ලෙස විමර්ශනය කිරීමෙන් පසු මෙම දිගු කාලීන ශේෂයන් අය කර ගැනීමට හෝ ගිණුම් පොත්වලින් ඒවා ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

----------------

| විගණන නිරීක්ෂණය<br>------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|
| 1996 වර්ෂයේ සිට මුල්‍ය ප්‍රකාශන වල රු.2,663,659 ක මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු විදේශ ආධාර ශේෂයන් පැවති අතර ඒ පිළිබඳ ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | විගණන, කළමනාකරණ කමිටුව සහ අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබාගෙන අධිකාරියේ ආදායමක් ලෙස විදේශ ආධාර ශේෂය ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ. | නිසි ලෙස විමර්ශනය කිරීමෙන් පසු මෙම දිගු කාලීන ශේෂයන් ඉවත් කිරීමට හෝ ගිණුම් පොත්වලින් ඒවා ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |

### 1.6.3 අත්තිකාරම්

-----------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)සැපයුම්, සාමාන්‍ය, ඉන්ධන, පුහුණු වැඩසටහන් වෙනුවෙන් ලබා දී තිබූ අත්තිකාරම්වල 2018 දෙසැම්බර් 31 දිනට මාසයක සිට අවුරුදු 15 දක්වා වූ කාල සීමාව තුලදී නොපියවූ ශේෂය රු. 811,852 ක් විය. | අත්තිකාරම් නියමිත වේලාවට අයකර ගැනීම සඳහා පියවර ගනු ලැබේ. | මුදල් අත්තිකාරම් පියවා නොගැනීම මගින් මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීමේ ගැටළුව මගහරවා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ආ) අත්තිකාරම් ලබා දුන් අරමුණු සම්පූර්ණ වූ වහාම පියවිය යුතුය. කෙසේ වෙතත්, අවස්ථා 38 කදී ප්‍රදානය කරන ලද රු. 1,853,134 ක් දින 31 සිට දින 141 දක්වා කාල සීමාව ප්‍රමාද කිරීමෙන් පසු පියවා තිබුණි. මෙම අත්තිකාරම් වලින් රු. 554,019 ක් එනම් 30% ක ප්‍රතිශතයකින් පමණ මුදල් මගින් නිරවුල් කර ඇත්තේ | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය පිළිපැදීමට නිසි අවධානය යොමු කළ යුතුය. |

අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන ය. එබැවින්, අත්තිකාරම් ලබා දීමට පෙර නිසි තක්සේරුවක් නොකිරීම හේතුවෙන් අධිකාරිය විසින් රාජ්‍ය අරමුදල අනිසි ලෙස භාවිතා කිරීමට ඉඩ ලබා දී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 මුදල් පනතේ 11 වන වගන්තිය | රු. 150,707,803 ක් අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වැනි කෙටි කාලීන ආයෝජන ප්‍රභවයන්හි ආයෝජනය කර තිබුණි. | ආයෝජනයක් ලෙස නොව පාරිතෝෂික ගෙවීමේ පිරිවැය සඳහා වූ අරමුදල් ලෙස තැන්පත් කර ඇත. | මුදල් පනතේ සහ අදාළ චක්‍රලේඛවල විධිවිධානවලට අනුකූල වීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ රජයේ මූල්‍ය රෙගුලාසි | | | |
| (i) මූල්‍ය රෙගුලාසි 371: 2015 ජූලි 14 දිනැති සංශෝධිත රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක පරිදි 03/2015 | (i) අත්තිකාරම් මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් ලබා දිය හැකි වුවද, මෙම විධිවිධානයට පටහැනිව අවස්ථා 07 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් 03 දෙනෙකුට සහ අවස්ථා 08 කදී රියදුරන් 07 දෙනෙකුට රු.1,095,375 ක් සහ රු .123,000 ක් ලබා දී තිබූ බව නියැදි විගණනයේදී අනාවරණය විය. | අධිකාරී මට්ටම් සහ රෙගුලාසි අනුගමනය කරමින් කාර්ය මණ්ඩල මට්ටමේ නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබා දීමට පියවර ගෙන තිබේ. | මූල්‍ය රෙගුලාසි වලට අනුකූල වීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. |
| | (ii) ගණකාධිකාරී වරයෙකුට උපරිම වශයෙන් රු. 100,000 ක් දක්වා පමණක් අත්තිකාරම් ලබාදීමට අනුමැතිය තිබුණද ඊට වැඩි ප්‍රමාණවලින් අත්තිකාරම් ලබාදීමේදී භාණ්ඩාගාරයෙන් | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට අවධානය යොමු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද අවස්ථා 15 කදී මාණ්ඩලික නිලධාරීන් 07 දෙනෙකුට සහ මාණ්ඩලික නොවන නිලධාරීන් 03 දෙනෙකුට රු .3,153,585 ක මුදලක් පූර්ව අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. | | |
| (ii) මූල්‍ය රෙගුලාසි 395 | බැංකු සැසඳුම් ප්‍රකාශයන් ඊළඟ මස 15 වන දිනට පෙර සෑම මසකම අවසන් වූ විට සකස් කළ යුතු වුවද, 2018 ජුනි මාසයේ සිට ප්‍රධාන කාර්යාලය සඳහා මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | සෑම මසකම මාසික බැංකු සැසඳුම් සකස් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය රෙගුලාසි වලට අනුකූල වීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ)යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති PED / 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 ඡේදය. | ණය ගැතියන්, ණය හිමියන් සහ තොග පිළිබඳ වයස් විශ්ලේෂණය සහ සෙමින් චලනය වන හා යල්පැනගිය තොග පිළිබඳ තොරතුරු වලට අදාල මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,261,094 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,044,982 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,216,112 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම, ශ්‍රවණාගාරයන් හා සම්මන්ත්‍රණ ශාලා කුලියට දීමෙන් ලබන කුලී ආදායම සහ පාඨමාලා ගාස්තු පිළිවෙලින් රු. 2,706,723, රු .4,509,484 සහ රු.4,617,732 ක් වැඩිවීම හා අයිඑල්ඕ (ILO) වැඩසටහනේ ලැබීම් රු. 9,629,547 ක් වීම මූල්‍ය ප්‍රතිඵල ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

-------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍රෝපකරණ, ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණ ශාලා කුලී ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.7,959,405 කින් එනම් 45.68% කින් වැඩි වී ඇති අතර ආයෝජන පොලී ආදායම 24.53% කින් වැඩි වී තිබුණි. ඒ අනුව ආයෝජන අගය පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 60 කින් වැඩි වීමට හේතු වී ඇත. (2017 වර්ෂයේ ආයෝජන රු. මිලියන 90 කි.)

(ආ)සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. 35,342,025 කින් වැඩි වී තිබූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් අධිකාරිය විසින් හඳුන්වා දී ඇති ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් විශ්‍රාම ගිය සේවකයින්ට රු.19,767,644 ක වන්දියක් ගෙවීම හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව, "ශිල්ප සවිය" පුහුණු වැඩසටහන් සඳහා | අයවැය පාලනය තුළින් ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳ නිසි අධීක්ෂණය සහ නිශ්චිත අරමුණු සඳහා යොදා | භාණ්ඩාගාර ප්‍රදාන අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට සහ ගිණුම්ගත කිරීමට කළමනාකරණය පියවර ගත |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු මුදල් පසුගිය වර්ෂවල දී සහ සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන රු. 182,244,511 ක් අධිකාරියේ ජංගම ගිණුම්වල පැවතුනි.එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු. 180,321,128 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,923,383 ක්වූ වෙනසට පිළිගත හැකි හේතු විගණනයට ලබාදී නොතිබුණි. | ගැනීමට පියවර ගනු ලැබේ. | යුතුය. |
| (ආ) 2017 වර්ෂයේදී පළුදු වූ භාණ්ඩ සඳහා රු .1,383,211 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන එය අඛණ්ඩව ගිණුම් වල පැවතුණි. | පළුදු වූ භාණ්ඩවල ශේෂය 2019 වර්ෂයේ දී ගැලපීමට පියවර ගනු ලැබේ. | නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු මේ ආකාරයේ ගිණුම් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) 2014 වර්ෂයේ අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරි පනතේ 12, 13 සහ 14 වගන්තිවල දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා රු. 150,707,803 ක මුදල් යොදවා නොගෙන ඉල්ලුම් තැන්පතු, භාණ්ඩාගාර | 2014 වර්ෂයේ අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරි පනතට අනුව කාර්යයන් ඉටු කිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් සඳහා ලබාගත් භාණ්ඩාගාර ප්‍රදානයන් කාර්යක්ෂමව උපයෝගී කර ගනිමින් 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| බිල්පත් සහ ස්ථාවර තැන්පතු වැනි කෙටිකාලීන ආයෝජන ප්‍රභවයන් සඳහා යොදවා තිබුණි. ඊට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තයෙන් 47% ක් එනම් රු .11,032,159 ක පොලී ආදායමක් උපයා තිබුණි. | | |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ජංගම ගිණුම් තුනක් සම්බන්ධයෙන් විගණනය වෙත ලැබුණු බැංකු ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය පුරා ඉහත බැංකු ජංගම ගිණුම්වල සාමාන්‍යය වූ රු. 212,973,855 ක මුදල් නිසි ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රියව පැවතුණි. තවද, 2018 දෙසැම්බර් 31 දින වන විට එම ජංගම ගිණුම්වල ශේෂය රු. 329,940,433 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස දළ වශයෙන් රු. මිලියන 21 ක මුදලක් රජයට අහිමි වී තිබුණි. | නිසි අධීක්ෂණය හා පාලනය යටතේ අරමුදල් කළමනාකරණය කිරීමට පියවර ගනු ලැබේ. | අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිෂ්ක්‍රීය සහ බැංකු ජංගම ගිණුම්වල මුදල් ශේෂයන් භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් හයිඩ්‍රොලික් පුහුණු කට්ටලය මිලදී ගැනීම සඳහා රු. 4,127,769 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබුණද 2019 අගෝස්තු 31 දක්වා එය මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | හයිඩ්‍රොලික් පුහුණු කට්ටලයක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී ජාතික තරඟකාරී මිල ගණන් කැඳවා තිබූ අතර ඒ සඳහා සැපයුම්කරු මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. නමුත් එම පිරිවිතර අවශ්‍යතාවයන්ට සරිලන අයුරින් නොවූ බැවින් මෙම අරමුදල් උපයෝගී කර ගනිමින් CETRAC ආයතනය සඳහා විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමට අධිකාරියේ කළමනාකාරිත්වය උපදෙස් දී ඇත. | අධිකාරිය විසින් ප්‍රමාදයකින් තොරව අරමුදල අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 වන විට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 390 ක් වූ අතර එම දිනය වන විට තථ්‍ය සේවක සංඛ්‍යාව 278 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 112 ක් විය. කෙසේ වුවද අධිකාරිය විසින් කාලානුරූපීව සේවක සංඛ්‍යා | 2019 වර්ෂයේදී පුරප්පාඩු වූ තනතුරු පිරවීමට සැලසුම් කර ඇත. | අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

සමාලෝචනයට ලක්කර යතාර්ථවාදී සේවක මට්ටමක් පවත්වාගෙන යාමට අපොහොසත් වී තිබුණි.

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය මුදල් හා සැලසුම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 ජුනි 26 දිනැති චක්‍රලේඛ අංක MOFP / ERD / 2014/1 හි විධිවිධානවලට අනුකූල නොවී සමාලෝචිත වර්ෂයේදී තෝරාගත් ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ (ජීසීසී) රටවල නිපුණතා වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකා කම්කරුවන්ගේ අවදානම අවම කිරීම සඳහා රු. 10,169,300 ක මුදලට අදාලව ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ ගිවිසුමකට එලඹ තිබුණි. එයින් රු. 9,629,548 ක් අධිකාරියට ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් වියදම් දරා තිබුණේ රු. 3,151,369 ක මුදලක් පමණි. ඉතිරි මුදල රු. 6,478,179 ක් විය. | මුදල් හා සැලසුම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 ජුනි 26 දිනැති චක්‍රලේඛ අංක MOFP / ERD / 2014/1 අනුව ඉදිරියේදී විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති වෙනුවෙන් කටයුතු කිරීමට පියවර ගනු ඇත. | මුදල් හා සැලසුම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 ජුනි 26 දිනැති චක්‍රලේඛ අංක MOFP / ERD / 2014/1 ට අනුව.ජාත්‍යන්තර සංවිධාන සමඟ කිසියම් ප්‍රදානයක් හෝ ණය ගිවිසුමකට එළඹීමට පෙර රේඛීය අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරය දැනුවත් කිරීමට ගත යුතු පියවර ගත යුතුය. |

**3.6 වාහන පද්ධතිය කළමනාකරණය**

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු වලට අනුව 2018 වර්ෂය තුළ අවස්ථා 18 කදී වාහන 12 ක් අනතුරු වලට ලක්ව ඇති අතර රු. 624,259 ක් එම වාහන අලුත්වැඩියා කිරීම සඳහා වැය කර තිබේ. කෙසේ වෙතත්, පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. තවද, මෙම වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහන අනතුරු ලේඛනයට අනුව, 2018 වර්ෂය තුළ වාහන 23 ක් අනතුරු වලට ලක්ව ඇති බව වාර්තා විය. කෙසේ වෙතත්, එම වාහන අළුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුදල එම ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන තිබෙන අතර අධිකාරිය යාවත්කාලීන කරන ලද හදිසි අනතුරු ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරනු ඇත. | අලාභයේ ප්‍රමාණය හා හේතු සොයා බැලීම සහ රක්ෂණ වන්දි ලබා ගැනීමට පෙර වගකීම නිවැරදි කිරීම සඳහා පරීක්ෂණ පැවැත්විය යුතුය. |

**3.7 වංචනික ස්වභාවයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 මැයි 28 දිනැති සී/1 18050175 ගෙවීම් වවුචරයට අමුණා ඇති ඉන්වොයිසියෙහි (දිනය, මුදල හා විස්තරය) වෙනස් කිරීමෙන් පසු රු.65,000 ක මුදලක් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී විසින් ලබා දී ඇත. | වංචනික ගනුදෙනු කිරීම වලක්වා ගැනීමට පියවර ගෙන ඇති අතර විමර්ශනයක් කිරීමට උපදෙස් දී ඇත. | මෙම ගනුදෙනුවට සම්බන්ධ නිලධාරියාට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම මඟින් මෙවැනි වංචනික ස්වභාවයේ ගණුදෙනු ඇතිවීම වලක්වා ගැනීමට අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |

## 3.8 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අධිකාරියේ ඵලදායී හා අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සඳහා 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති පහත සඳහන් ක්‍රියාකාරකම් අධිකාරිය විසින් ඉටු කර නොතිබුණි. | | | |
| **පනතේ ප්‍රතිපාදන සඳහා යොමු කිරීම** | **ඉලක්ක ක්‍රියාකාරකම්** | | |
| ඡේද අංක 07 | වර්ෂයක් තුළ අවම වශයෙන් මාස තුනකට වරක ජාතික උපදේශක සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | 2019.02.12 හා 2019.06.24 රැස්වීම් 02ක් පවත්වා ඇති අතර ළඟදීම තවත් රැස්වීමක් කැඳවීමට පියවර ගනු ලැබේ. | රටේ ඉදිකිරීම් කර්මාන්තයේ උචිත හා ප්‍රතිඵලදායී මෙහෙයුම් සහ සංවර්ධනය සඳහා පනතේ සඳහන් ක්‍රියාකාරකම් වහාම ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ඡේද අංක 13(k),(m) සහ (q) | මෙම විධිවිධාන යටතේ අධිකාරිය විසින් ඉටු කළ යුතු කාර්යයන් ඉටු කර නොතිබුණි. | 13 (k) දේපල සංවර්ධකයින්ගේ ලියාපදිංචිය ළඟදීම ආරම්භ කරනු ඇත.<br>13 (m) ඉදිකිරීම් ද්‍රව්‍ය හා සංරචක ආනයනකරුවන්, නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලිය සකස් කිරීම ළඟදීම ආරම්භ කෙරේ. රීති ළඟදීම ප්‍රකාශයට පත් කෙරේ. | |

| | | | |
|---|---|---|---|
| | | 13 (q) බර වාහන (Heavy) ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නාමාවලිය පවත්වා ගෙන යාම ආරම්භ කරන ලදී. රීති ප්‍රකාශයට පත් කර ඇත. | |
| ඡේද අංක 19 (1) | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීමට අපොහොසත් විය. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල තවමත් ස්ථාපිත කර නොමැත. සියලු අරමුදල් ඒකාබද්ධ අරමුදල හරහා ක්‍රියාත්මක කළ යුතු බව කැබිනට් මණ්ඩලය තීරණය කර තිබීම හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන බද්ද, ඒකාබද්ධ අරමුදල හරහා ලබා ගත යුතු නිසා 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් දැනටමත් අනුමත කර ඇති අතර නීති කෙටුම්පත්කරු වෙත යවනු ලැබ ඇත. සංශෝධන පනත අවසන් වූ පසු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල ස්ථාපිත කරමින් රෙගුලාසි ප්‍රකාශයට පත් කෙරේ. | රටේ ඉදිකිරීම් කර්මාන්තයේ උචිත හා ප්‍රතිඵලදායී මෙහෙයුම් සහ සංවර්ධනය සඳහා පනතේ සඳහන් ක්‍රියාකාරකම් වහාම ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී හා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඡේද අංක 41 | දේපල සංවර්ධකයින්ගේ දේපල ලේඛනයක් පවත්වාගෙන යාම | දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීම - මෙම කාර්යය ළඟදීම ආරම්භ වේ. | රටේ ඉදිකිරීම් කර්මාන්තයේ උචිත හා ප්‍රතිඵලදායී මෙහෙයුම් සහ සංවර්ධනය සඳහා පනතේ සඳහන් ක්‍රියාකාරකම් වහාම ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී හා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ඡේද අංක 43 | ආනයනකරුවන්ගේ,නිෂ්පාදකයින්ගේ සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හා ඉදිකිරීම් සංරචක සැපයුම්කරුවන්ගේ නාමාවලියක් පවත්වාගෙන යාම. | ඉදිකිරීම් ද්‍රව්‍ය හා සංරචක පිළිබඳ ආනයනකරුවන්, නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලිය - මෙම කාර්යය ළඟදීම ආරම්භ කෙරේ. රීතිය ළඟදීම ප්‍රකාශයට පත් කෙරේ. | |

**3.9 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂිකව භෞතික සත්‍යාපනය සිදු කිරීම, හානිය අලාභ හඳුනා ගැනීම සහ දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම වැනි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සැලසුම් කර ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | දේපල, පිරියත සහ උපකරණ සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට පියවර ගනිමින් සිටී. | දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 සහ 2017 වසර සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදාළ වාර්ෂික වාර්තා අමාත්‍යාංශයට යැවීමට පියවර ගෙන ඇති අතර එය ළඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව එම වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය.. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර අයිතම 78 සම්බන්ධයෙන් 25% සිට 1634% දක්වා සැලකිය යුතු විචලනයන් පැවතුණි.ඒ අනුව අයවැය ඵලදායී පාලන ක්‍රමයක් ලෙස කළමනාකරණය භාවිතා කර නොතිබුණි. | වාර්ෂික අයවැය වෙනස්කම් අවම කරමින් සකස් කිරීමට පියවර ගනු ඇත. | කළමනාකරණ පාලනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අයවැය භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |